කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

කාර්ය පත්‍රිකාව

විෂය- ව්‍යාපාර සංඛ්‍යානය

**සංඛ්‍යාන අනුමිතිය සඳහා නියැදි සමානුපාත දෙකක අන්තරයෙහි නියැදුම් ව්‍යාප්ති ගොඩ නගයි.**

ශ්‍රේණිය - 13

පාඩම - 7

නිපුණතාව 7.0 - ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.
නිපුණතා මට්ටම 7.5 - සංඛ්‍යාන අනුමිතිය සඳහා නියැදි සමානුපාත දෙකක අන්තරයෙහි නියැදුම් ව්‍යාප්ති ගොඩ නගයි.

**<u>අභ්‍යාස 01</u>**

එක්තරා රෝගයක් සුව කිරීම සඳහා භාවිත කරන A නම් ඖෂධය මගින් රෝගය සුව වීමේ සමානුපාතය 0.85ක්ද B නම් ඖෂධය මගින් රෝගය සුව වීමේ සමානුපාතය 0.78ක්ද වන බව පෙනී ගොස් ඇත.A ඖෂධය භාවිත කරන රෝගීන් 100 දෙනෙකුද B ඖෂධය භාවිත කරන රෝගීන් 200 දෙනෙකු ද බැගින් වූ සසම්භාවී නියැදි දෙකක් ගෙන පරීක්ෂා කළ විට A ඖෂධය මගින් රෝගය සුව වීමේ සමානුපාතය B ඖෂධය මගින් රෝගය සුව වීමේ සමානුපාතයට වඩා 0.1කින් වැඩි වීමේ සම්භාවිතාව කොපමණද?

**<u>අභ්‍යාස 02</u>**

A පන්තියේ $M_1$ ලෙස පිරිමි ළමයෙකු හා $F_1$, $F_2$ ලෙස ගැහැණු ළමුන් දෙදෙනෙකු සිටී යැයි ද B පන්තියේ $M_1$,$M_2$ ලෙස පිරිමි ළමයින් දෙදෙනෙකු හා $F_1$ ලෙස ගැහැණු ළමයෙකු සිටී.

1. A පන්තියේ මුළු සිසුන් තුන් දෙනාගෙන් සිසුන් දෙදෙනා බැගින් ගෙන සෑදිය හැකි සියලු නියැදි ලියන්න.
2. A පන්තියේ නියැදිවල ගැහැණු ළමයින්ගේ සමානුපාත පිළිවෙලින් ලියා දක්වන්න.
3. B පන්තියේ මුළු සිසුන් තුන් දෙනාගෙන් සිසුන් දෙදෙනා බැගින් ගෙන සෑදිය හැකි සියලු නියැදි ලියන්න.
4. B පන්තියේ නියැදිවල ගැහැණු ළමයින්ගේ සමානුපාත පිළිවෙලින් ලියා දක්වන්න.
5. A පන්තියේ නියැදිවලින් ලැබුණු සමානුපාත හා B පන්තියේ නියැදිවලින් ලැබුණු සමානුපාත අතර වෙනස ලබා ගත හැකි සියලු ආකාර ලියා එක එකෙහි සමානුපාත අතර වෙනස්කම් ලියා දක්වන්න.
6. සමානුපාත අතර වෙනස සඳහා ලැබී ඇති විවිධ අගයන් සටහන් කරන්න.
7. එක් එක් අගයන්ට අනුරූප සම්භාවිතා ලියා දක්වන්න.